22 කලාපය

1992 ජුලි/අගෝස්තු

# විද්‍යා ව්‍යාප්ති



## මිහි කත ගේ දරු පරපුර



# විද්‍යා ව්‍යාප්ති

22 කලාපය 1992 ජුලි / අගෝස්තු

ඇතුල් පිටු

1 ජනසංඛ්‍යා දත්ත මූලාශ්‍ර — 03
ආචාර්ය කේ. ඒ. පී. සිද්ධිසේන

2 ජනසංඛ්‍යාවක ප්‍රමාණය, ව්‍යාප්තිය, වර්ධනය
සහ සංයුතිය තීරණය කරණ සාධක — 07
ආචාර්ය කේ. ජ. පී. සිද්ධිසේන

3 ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය සහ
ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක — 11
සෝමා ද සිල්වා

4 ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යා සංයුතීන්:
වයස් සංයුතිය තුළ සිදුවන වෙනස්කම් සහ
ඒවායේ ප්‍රතිවිපාක — 16
ආචාර්ය ඩබ්. ඉන්ද්‍රලාල් ද සිල්වා

5 ශ්‍රී ලංකාවේ නාගරිකරණ රටා සහ ප්‍රවණතා — 25
මහාචාර්ය කුසුමා ඒ. ගුණවර්ධන

6 ලෝක ජනසංඛ්‍යා වර්ධනය සහ ව්‍යාප්තිය — 29
ආචාර්ය ඩබ්. ඉන්ද්‍රලාල් ද සිල්වා

7 ජනගහන වර්ධනය, පාරිසරික ගැටළු
සහ ප්‍රතිවිපාක — 37
ආචාර්ය ඩබ්. ඉන්ද්‍රලාල් ද සිල්වා

සංස්කරණය:

මිල රු. 10/-

කාන්තා නිර්මලී ලංකාතිලක
ආචාර්ය උපාලි සමරජීව

කවර නිර්මාණය: දර්ශන කරුණාතිලක
පිටුපස කවරයේ විස්තරය: කෝලිත රණවක

'විද්‍යා ව්‍යාප්ති', ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ
විද්‍යා ව්‍යාප්ති කමිටුවේ ප්‍රකාශණයකි.

# ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යා සංයුතීන්: වයස් සංයුතිය තුළ සිදුවන වෙනස්කම් සහ ඒවායේ ප්‍රතිවිපාක

ප්‍රජා විද්‍යා පුහුණු හා පර්යේෂණ ඒකකය
කොළඹ විශ්ව විද්‍යාලයය, කොළඹ.
ආචාර්ය ඩබ්ලිව්. ඉන්ද්‍රලාල් ද සිල්වා

**ශ්‍රී ලංකාවේ වයස් ව්‍යුහයේ වෙනස්කම් සමස්තයක් ලෙස ගත්විට අපගේ ඉදිරි සැළසුම් සම්පාදනයේ දී අවධාරණයට ලක්විය යුතු කරුණු කිහිපයකි.**

**ඒවා නම්, පූර්ව පාසල් සහ පාසල් යන වයස් වල ජන සංඛ්‍යාවේ ප්‍රමාණය අඩුවීම, වැඩ කරන වයස් වල ජනසංඛ්‍යාව වැඩි වීම සහ ඒ හා සම්බන්ධ ශීඝ්‍රයෙන් වැඩිවන රැකියා ඉල්ලුම, ශීඝ්‍ර යෙන් වැඩිවන වයස්ගත ජනසංඛ්‍යාව සහ ඒ හා සම්බන්ධයෙන් පැන නගින සමාජ හා ආර්ථික ප්‍රශ්නය.**

**මෙම ගැටලු ඒවායේ උපරිමයට ලඟා වීමට පෙර ක්‍රියාත්මක වීම සැළසුම් සම්පාදකයින් සතු කාර්යයකි.**

ප්‍රජා විද්‍යාව යටතේ ජන සංඛ්‍යාවේ ප්‍රමාණය, ව්‍යාප්තිය සහ සංයුතිය යන මූලිකාංග අධ්‍යනය කරනු ලබයි. මෙම මූලිකාංග වල වෙනස්වීම් සාඵල්‍යතා වය, මර්තෘතාවය, සංක්‍රමණය සහ විවාහකත්වය යන ප්‍රජා විද්‍යාත්මක සංරචක මත රඳ පවතී. මෙම සංරචක වල බලපෑම් නිසා ජන සංයුතීන්හි වෙනස් කම් මෙන්ම සංයුතීන් වල ස්වභාවය අනුව සංරචක වල ක්‍රියාකාරීත්වයන්ද වෙනස් වේ.

## ජන සංඛ්‍යා සංයුතීන්

සංයුතිය යන්නෙන් අදහස් කරන්නේ, යම් විශේෂ ගති ලක්ෂණයකට අදාලව එකී ජනසංඛ්‍යාව සැදී තිබෙන ආකාරයයි. ජන සංඛ්‍යාවක විවිධ සංයුතීන් දැකිය හැකිය. ස්ත්‍රී පුරුෂ සංයුතිය, වයස් සංයුතිය, විවාහකත්වය පිළිබඳ සංයුතිය, ජාතීන් හා ආගම් පිළිබඳ සංයුතිය, අධ්‍යාපන සංයුතිය සහ